# විරකැටිය ප්‍රාදේශීය සභාව
## මාසික සභා රැස්වීම - 2023 මාර්තු 15

වර්ෂ 2023 ක් වූ මාර්තු මස 15 වන දින පෙරවරු 10.30 ට විරකැටිය ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී පැවති 06 වැනි සැසි වාරයේ 60 වැනි මාසික සභා රැස්වීමේ ලුහුඬු වාර්තාවයි.

පැමිණීම :-

| | | | |
|---|---|---|---|
| 1. | පියසේන ලියනආරච්චි | - | ගරු සභාපති |
| 2. | මදරසිංහගේ සුමනසේන | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | වරාගේන ලියනගේ අනුර ද අල්විස් | - | ගරු උප සභාපති |
| 4. | ගුණතිලක ජයසේකර | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | පද්මල් රුබසිංහ | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6. | මුණසිංහ ලියනආරච්චිගේ රංජිත් | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7. | රණවීර ආරච්චිගේ ආරියරත්න | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | කලංචිගේ රංජිත් මුණතුංග | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9. | දහනායක සේපාල | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 10. | බැදිගම කපුගේ චන්ද්‍රසේන | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | ගමගේ සරත් කුමාර සිරි | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | හේවා ගම්මැද්දගේ ඉන්දික කුමාර | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 13. | විජමුණිගේ රණතුංග | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 14. | චමිත් ක්‍රිෂාන්ත කුමාර ලියනආරච්චිගේ | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 15. | විමල් ප්‍රදීප් කුමාර හෙට්ටිආරච්චි | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 16. | ජයවික්‍රම ආරච්චිගේ සන්ධ්‍යා ශ්‍රියානි | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 17. | රණවීර ගමගේ සෝමාවති | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 18. | මුණසිංහ ආරච්චිගේ ශ්‍රියානි | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 19. | දඩල්ලගේ දයාවති | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 20. | විජමුනිගේ දර්ශන සම්පත් කුමාර | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 21. | විජමුනි දූරගේ රත්නපාල | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 22. | කොඩිකාරගේ වත්සලා මධුෂානි කොඩිකාර | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 23. | පල්ලිය ගුරුගෙයි දොන් ලක්ෂ්මන් චන්ද්‍රරත්න අබේවර්ධන | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 24. | ලියනආරච්චිගේ චන්ද්‍රදාස | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 25. | කංකානම්ගේ මිලාන් මධුවන්ත | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 26. | ලියන ආරච්චිගේ නාලක හේමන්ත | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 27. | දෙවුන්දර සිත්තර බඩල්ගේ විපුලසේන | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 28. | නිමල් දොන් ප්‍රැන්සිස්කු | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 29. | ආයිත්තප්පුලිගේ චාමර මිහිරංග | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

නොපැමිණීම :-

| | | | |
|---|---|---|---|
| 1. | ලියනපතිරණගේ සිරිසේන | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 2. | රාම්නායකගේ අරුණසිරි | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | මනතුංගේ ගුණරත්න | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | නානායක්කාර වසන් අප්පුගේ ගීතිකා කවුන්දදී හේමාලි | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 5. | ජයසිං බෝල්ප ගමගේ චාමිකා ක්‍රිෂාන්ති | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 6. | හේවාගමගේ සුරංග පුෂ්පකුමාර | - | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

මූලාසනය :- ගරු සභාපති පියසේන ලියනආරච්චි මහතා

අද දින සභා රැස්වීම සඳහා වීරකැටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ජේ.ජේ. ජගත් චමින්ද මහතා සහභාගී විය.

**පිළිගැනීම :-**

ගරු සභාපති පියසේන ලියනආරච්චි මහතා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ඇතුළු කාර්යාලයේ නිලධාරී මණ්ඩලය සහ මාධ්‍යවේදී මහතා ඇතුලු සියලු දෙනාම ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගන්නා ලදී.

**ආගම සිහිකිරීම :-**

සියලු දෙනාම තිසරණ සහිත පංචශීලය සමාදන් විය.

**ජාතික ගීය ගායනා කිරීම :-**

සියලු දෙනාම එක්ව ජාතික ගීය ගායනා කරන ලදී.

**රට ජාතිය වෙනුවෙන් කැපවුනු සියලු විරුවන් වෙනුවෙන් විනාඩි 2 ක නිශ්ශබ්දතාවය රැකීම :-**

රැස්ව සිටි පිරිස විනාඩි 02 ක නිශ්ශබ්දතාවය පළ කරන ලදී.

**නිවාඩු අනුමත කිරීම :-**

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ලියනපතිරණගේ සිරිසේන මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රී රාමනායකගේ අරුණසිරි මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රී මිනතුංගේ ගුණරත්න මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී නානායක්කාර වසන් අප්පුගේ හිතිකා කවුන්දරී හේමාලි මහතා, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ජයසිං බෝල්ප ගමගේ චාමිකා ක්‍රිශාන්ති මහත්මිය සහ ගරු ප්‍රා.ස. මන්ත්‍රී හේවාගමගේ සුරංග පුෂ්පකුමාර මහතා මහතා අද දින සභාවට නොපැමිණෙන බව මා වෙත වාර්තා කර ඇති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

ඒ අනුව එම මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**01. පසුගිය රැස්වීමේ වාර්තාව අනුමත කිරීම :-**

පසුගිය මාසික සභා රැස්වීමේ න්‍යාය පත්‍රයත් සමග සභා වාර්තාව සියලු මන්ත්‍රීතුමන්ලාට ලැබෙන්නට සලස්වා ඇති බැවින්, කියවා සංශෝධන ඇතොත් එම සංශෝධන ඉදිරිපත් කරන ලෙසත්, එසේ සංශෝධන නොමැති නම් සංශෝධන නොමැති සේ සලකා සභා සම්මත කරන ලෙසත්, ගරු සභාපතිතුමා විසින් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ඒ අනුව පසුගිය මාසික සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**02. මූලාසනයේ විශේෂ නිවේදන :-**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ නීත්‍යානුකූලව සභා රැස්වීම අද දිනෙන් අවසන් වන බවයි. සියලුම දෙනා තර්ක විතර්ක මධ්‍යයේ වුවද, ඉතා සහයෝගයෙන් වැඩ කටයුතු කරන ලදී. ඒ පිළිබඳවත් මා හට ලබාදුන් සහයෝගය පිළිබඳවත් සියලුම දෙනාට ස්තූතිය පුදකරන ලදී. නීත්‍යානුකූලව කළ හැකි ග්‍රාමීය සංවර්ධන කටයුතු විශාල වශයෙන් සංවර්ධනය කර ඇත.

**03. සංදේශ, පෙත්සම්, පැමිණිලි සහ ආයාචනා සභාගත කිරීම :-**

03.1 හම්බන්තොට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මගින් එවා ඇති වීරකැටිය ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වැටිය විදානගමගේ චම්පා නිල්මිණී මහත්මියගේ එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වය අහෝසි කොට නෙරපා හැරීම සම්බන්ධව එවා ඇති ලිපිය සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

03.2 පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් එවා ඇති වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. වත්කම් බැරකම් ප්‍රකාශ මේ වන විට ලබා දී නොමැති සියලුම මහජන නියෝජිතයින් එම වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදෙන ලෙස දන්වා සිටින ලදී.

04. කාරක සභා වාර්තා :-

4.1 මුදල් කමිටුව :

2023.03.07 දින පැවති මුදල් කමිටු වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. මුදල් කමිටු වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී සේපාල දහනායක මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී බී.ජේ. චන්ද්‍රසේන මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

4.2 කර්මාන්ත කමිටුව :

හෙළ බොජුන් හල පඩිපෙල සකස් කිරීම සම්බන්ධ රු. 205656.25 ක ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. ජලය අඩුවීමත් සමග පඩි පෙළ සේදියාම නිසා කුහර බවට පත්වී ඇත. එම නිසා එය අලුත්වැඩියා කළ යුතුය.

ඒ අනුව හෙළ බොජුන් හල පඩිපෙල සකස් කිරීම සම්බන්ධ රු. 205656.25 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

4.3 සංවර්ධන හා උපදේශන කමිටුව : නැත

4.4 පරිසර කමිටුව : නැත

4.5 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව : නැත

05. සභාවේ ආදායම් සහ වියදම් වාර්තා සහ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම :-

ඒකාබද්ධ වැය සාරාංශය - 2023 ජනවාරි මාසය

| | |
|---|---|
| වැටුප් හා දීමනා | 4812660.73 |
| ගමන් වියදම් | 1540.00 |
| සැපයුම් හා උපකරණ | 136805.00 |
| ප්‍රාග්ධන වත්කම් අ.වැ.හා නඩත්තුව | 202510.00 |
| ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක සේවා | 34473.51 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | - |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | - |
| පුනරාවර්තන වියදම්වල එකතුව | 5187989.24 |
| ප්‍රාග්ධන වැය | 78000.00 |
| ණය ආපසු ගෙවීම | - |
| ප්‍රාග්ධන වැය එකතුව | 78000.00 |
| මාසයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් එකතුව | **5265989.24** |
| විවිධ ණය හිමියෝ | 2213016.34 |
| අත්තිකාරම් | 19000.00 |
| තැන්පත් | 453354.82 |
| සේවක ණය | 500000.00 |
| ණය ගැති | - |
| අතිරික්ත/ඌණතා/වෙනත් (ගිණුම් අතර මුදල් මාරු) | - |
| **මාසයේ මුළු ගෙවීම් එකතුව** | **8451360.40** |

ඒකාබද්ධ ලැබීම් සාරාංශය - 2023 ජනවාරි මාසය

| | |
|---|---|
| වරිපනම් හා බදු | 558728.27 |
| කුලී | 1539275.50 |
| බලපත්‍ර ගාස්තු | 113600.01 |
| සේවා සඳහා ගාස්තු | 232110.00 |
| වරෙන්තු ගාස්තු | 21729.73 |
| වෙනත් ආදායම් | 61832.47 |
| වෙනත් ආධාර | 4692932.34 |

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | 7220208.32 |
| මූලධන ලැබීම් | - |
| පුනරාවර්තන හා ප්‍රා. ආදායම්වල මුළු එකතුව | **7220208.32** |
| සේවක ණය | 878822.84 |
| තැන්පත් | 2088446.43 |
| අත්තිකාරම් | 4830.00 |
| විවිධ ණය ගැති | 21899147.82 |
| ආදායම් හා වෙනත් ලැබීම් (විවිධ ණයගැති) | 34461.54 |
| මුළු එකතුව | **32125916.95** |

<u>ගිහ ආදායම් විස්තර - 2023 ජනවාරි මාසය</u>

| | |
|---|---|
| වරිපනම් හා බදු | 6548576.66 |
| කර්මාන්ත | 30500.00 |
| ව්‍යාපාර බදු | 331800.00 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 61000.00 |
| රථවාහන නැවතුම් | 652014.96 |
| කඩ කාමර කුලී | 1087600.00 |
| පොළ බදු | 21568985.30 |
| අක්කර බදු | 43423.24 |
| දැන්වීම් පුවරු | - |
| උසාවි දඩ | 707710.00 |
| මුද්දර ගාස්තු | 123.00 |
| වීදි පහන් | 263640.00 |
| යන්ත්‍ර කුලී | - |
| එකතුව | **31295373.16** |

ලැබීම් සහ ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ සහ ගිහ ආදායම් විස්තර සත්‍ය විස්තර ඇතුලත් වාර්තා සත්‍ය වාර්තා වන බැවින්, එම වාර්තා සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.එම්. රණතුංග මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**06.** කල් දෙනු ලැබූ ප්‍රශ්න :- නැත

**07.** කල් දෙනු ලැබූ යෝජනා :-

07.1 මුදල් ගණන් කිරීම සහ වලංගුතාවය පරීක්ෂා කිරීමේ යන්ත්‍රයක් ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. මුදල් භාරගැනීමේ දෛනික රාජකාරියේ දී මුදල්වල වලංගුතාවය පරීක්ෂා කිරීම සම්බන්ධව දැඩි අපහසුතාවයට පත්ව ඇති බැවින්, ඒ සඳහා මුදල් ගණන් කිරීම සහ වලංගුතාවය පරීක්ෂා කිරීමේ යන්ත්‍රයක් පෙරටු කාර්යාලයට ලබාදෙන ලෙස ඉල්ලා ඇත.

ඒ අනුව හොඳම වර්ගයේ මුදල් ගණන් කිරීම සහ වලංගුතාවය පරීක්ෂා කිරීමේ යන්ත්‍රයක් කඩිනමින් ලබාගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.2 යන්ත්‍රෝපකරණ ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. සභාව සතු බර වාහන ප්‍රවාහනය සඳහා රෝද හතරේ ට්‍රැක්ටරය මගින් ඇදෙන යා හැකි ට්‍රේලර් තට්ටුවක් සහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කසළ කළමනාකරණ කටයුතු සඳහා භාවිතා කිරීමට කුඩා ප්‍රමාණයේ ලෝඩර් රථයක් අත්‍යවශ්‍ය වී ඇත.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ලක්ෂ්මන් පල්ලියගුරු මහතා පවසා සිටියේ පසුගිය කාලයේ කොමසාරිස් පාලනය යටතේ කටයුතු කරන විට ගැටලු මතු වූ බවයි. මෙම මිලදී ගැනීම් සිදුකිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් තුළ වගකිවයුතු නිලධාරීන් හරහා සිදුකිරීම සුදුසු බව එතුමාගේ අදහස විය.

එක් පුද්ගලයෙකුට කොම්පෝස්ට් කි.ග්‍රෑම් 1000 ක් පමණ අවශ්‍යවීම නිසා ඊයේ දින කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට ගිය අතර, එහිදී කොම්පෝස්ට් කි.ග්‍රෑම් 100 ක් පමණක් එම ස්ථානයෙන් මිලදී ගැනීමට හැකියාවක් තිබූ ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් පවසන ලදි. නමුත්, දිරන ලද කොම්පෝස්ට් විශාල ප්‍රමාණයක් ඇත. එම නිසා බොක්කැට් යන්ත්‍රයක් කඩිනමින් මිලදී ගැනීම සුදුසුය.

පළාත් පාලන අමාත්‍යාංශයේ ඉංජිනේරුතුමාගේ අනුමැතිය ලබාගෙන භාවිතා කරන ලද බොක්කැට් යන්ත්‍රයක් සහ ක්‍රියාවිරහිත වූ යන්ත්‍ර පටවා රැගෙන ඒම සඳහා ග්ලෝබෙඩ් එකක් කඩිනමින් මිලදී ගැනීම සුදුසු ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.3 මෝටර් ග්‍රේඩර් සහ බැක්හෝ යන්ත්‍ර යොදාගෙන බල ප්‍රදේශයේ අබලන් වූ මාර්ග කඩිනමින් අලුත්වැඩියා කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

පාපැදියෙන් හෝ ගමන් කිරීමට නොහැකි මාර්ග බල ප්‍රදේශයේ පවතින බැවින්, එම මාර්ග කඩිනමින් අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.4 70 ශ්‍රී 8192 අත් ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. මෙම අත් ට්‍රැක්ටර් රථය 2011 වර්ෂයේ සිට මේ දක්වා ධාවන තත්වයේ නොපවතින අතර, සභාව සතු අක්‍රිය තත්වයේ පවතින වාහනයක් ලෙස 70 ශ්‍රී 8192 දරණ අත් ට්‍රැක්ටරය විගණනයට ද ලක්ව ඇත.

ඒ අනුව 70 ශ්‍රී 8192 අත් ට්‍රැක්ටර් රථය පළපුරුදු කාර්මිකයකු යොදවා අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ජේ.ඒ. සන්ධ්‍යා ශ්‍රියාණි මහත්මිය විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.5 2023 වර්ෂයේ වෙන්වී ඇති ප්‍රතිපාදන මගින් පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. පහත සඳහන් ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කර යවා ඇත.

1. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ඉදිකිරීම - රු. 6188937.69
2. වලස්මුල්ල පොදු වෙළඳපොළ රුහුණු රස හෙළ බොජුන්හල ඉදිකිරීම (1 කොටස) - රු. 5129310.40
3. වලස්මුල්ල පොදු වෙළඳපොළ රුහුණු රස හෙළ බොජුන්හල ඉදිකිරීම (2 කොටස) - රු. 3770944.53
4. වීරකැටිය ප්‍රාදේශීය සභා පුස්තකාල කටයුතු ස්වයංක්‍රීයකරණය සඳහා කොහා මෘදුකාංගය ස්ථාපනය කිරීම සඳහා පරිගණක ලබාගැනීම - රු. 900000.00
5. ටිවර් හීලිං නිවාඩු නිකේතනය - රු. 7444145.83

ඒ අනුව ඉහත සඳහන් ව්‍යාපෘති අනුමත වුවහොත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී චමින් ලියනආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.6 වීරකැටිය ප්‍රධාන කාර්යාලය සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. දැනට භාවිතා කරන ලද ඇඟිලි සලකුණු යන්ත්‍රය අක්‍රිය වී ඇති අතර, එම යන්ත්‍රය අලුත්වැඩියා කළ නොහැකි තත්වයට පත්වී ඇත. එම නිසා නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගත යුතුය.

ඒ අනුව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී පද්මල් රුබසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සහා සම්මත විය.

07.7 නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය මගින් එවා ඇති වලස්මුල්ල නගර සංවර්ධනය පිළිබඳ සාකච්ඡාව සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. වලස්මුල්ල නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු මේ වන විට 75% ක් පමණ අවසන් කර ඇත. නමුත් නිවාස 10 ක් ඉදිකරදීමට අවශ්‍යව ඇති බැවින්, එම කටයුතු ප්‍රමාද වී ඇත. නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ගෝසාතකාගාර ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට ලබාදී ඉඩමෙහි වටිනාකම සලකා බලා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් සභාවට පවරාගෙන කටයුතු කිරීමට තීරණය කර ඇත.

වලස්මුල්ල ගෝසාතකාගාරයේ ඉඩමේ වටිනාකම ප්‍රමාණයට නගරයෙන් ඉඩම් කොටසක් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලබාගෙන වලස්මුල්ල ගෝසාතකාගාරයේ ඉඩම නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ලබාදීම සුදුසු බවට ගරු උප සභාපති අනුර

ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.එස්.බී. විපුලසේන මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.8 වලස්මුල්ල ඔයගාවත්ත වැඩිහිටි නිවාසයේ කාමරයක වැඩ අවසන් කරගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. වලස්මුල්ල නගර සංවර්ධනයේදී කඩා ඉවත් කිරීමට යෝජිත නිවසක පදිංචිව සිටින කේ.බී. ජේමාවතී යන අයට තාවකාලික නවාතැන් පහසුකම් සැලසීම සඳහා වලස්මුල්ල ඔයගාවත්ත වැඩිහිටි නිවාසයේ කාමරයක වැඩ අවසන් කරදෙන ලෙස 2023.03.08 දින පැවති සාකච්ඡාවේදී නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉල්ලා ඇත. එම කාමරය සකස් කර ලබාදී කේ.බී. ජේමාවතී යන අය එම ස්ථානයේ තාවකාලිකව පදිංචි කර වලස්මුල්ල ගෝසාතකාගාර ඉඩමේ නව නිවාස ඉදිකිරීමෙන් පසුව එම කාන්තාවට ගෝසාතකාගාර ඉඩමේ නිවාස ව්‍යාපෘතියෙන් නිවසක් ලබාදී එහි පදිංචි කිරීමේ කොන්දේසිය මත ලබාදිය හැකිය. ඔයගාවත්ත වැඩිහිටි නිවාසය සඳහා ඉදිකර ඇති ගොඩනැගිල්ල සභාවේ සංචාරක බංගලාවක් වශයෙන් සකස් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමාගේ අදහස විය.

ගරු උප සභාපතිතුමා විසින් අදහස් දක්වමින් පවසා සිටියේ එම ස්ථානයේ වැඩිහිටි නිවාසයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාවගේ විරෝධතාවයක් ඇති බවයි.වලස්මුල්ල ඔයගාවත්ත වැඩිහිටි නිවාසය සභාවේ සංචාරක බංගලාවක් වශයෙන් නිර්මාණය කිරීම සුදුසු බවත්, එය නිර්මාණය කරන තෙක් එම ගොඩනැගිල්ලේ කාමරයක් සහා අරමුදලින් ඉදිකර කේ.බී. ජේමාවතී මහත්මියට පදිංචිය සඳහා ලබාදීම සුදුසු බවත් ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදි.

වැඩිහිටි නිවාසයක් අත්‍යාවශ්‍ය බව ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.එස්.බී. විපුලසේන මහතාගේ අදහස විය.

ඒ අනුව වලස්මුල්ල ඔයගාවත්ත වැඩිහිටි නිවාසය සභාවේ සංචාරක බංගලාවක් වශයෙන් නිර්මාණය කිරීම සුදුසු බවත්, එය නිර්මාණය කරන තෙක් එම ගොඩනැගිල්ලේ කාමරයක් සභා අරමුදලින් ඉදිකර කේ.බී. ජේමාවතී මහත්මියට පදිංචිය සඳහා ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07.9 නව ලේඛනාගාරයක් සකස් කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. පැරණි ලේඛනාගාරයෙහි ඉඩ පහසුකම් අවම වීම හේතුවෙන් පැරණි ලිපිලේඛන ස්ථානගත කිරීමට සුදුසු ස්ථානයක් නොමැති වීම විශාල ගැටලුවක් වී ඇත. එම නිසා ලේඛන ගොනු පිළිවෙලට හා අලංකාරව තැන්පත් කිරීමට සුදුසු ෆයිල් කබඩ් මිලදී ගැනීමට අවශ්‍ය බව තාක්ෂණ නිලධාරී මහතා විසින් නිර්දේශ කර ඇත.

ඒ අනුව නව ලේඛනාගාරයක් සකස් කිරීම සඳහා කබඩ් 06 ක් මිලදී ගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ. මිලාන් මඩුවත්ත මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.10 ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් ඉදිරිපත් කර ඇති සාම විනිසුරු පදවි ලබාදීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා අදහස් දක්වමින් පවසා සිටියේ සභාවේ වසර 33 ක අඛණ්ඩ සේවා කාලයක් ගරු සභාපතිතුමාටත්, ගරු ප්‍රා.ස. මන්ත්‍රී සිරිසේන ලියනපතිරණ මහතාටත්, මා හටත් ඇති බවයි. මෙම මස 20 වන දිනෙන් පසු සාම විනිසුරු තනතුර අහිමි වන අතර, සියලු මන්ත්‍රීතුමන්ලාගේ සභාවේ වසර ගණනක සේවා කාලයක් පවතී. එම නිසා ජනතාවට කරන සේවය වෙනුවෙන් සියලු මන්ත්‍රීතුමන්ලාට සාම විනිසුරු පදවිය ලබාදෙන ලෙස අධිකරණ ඇමතිතුමාට දන්වා යවන ලෙස ඉල්ලීමක් කරන ලදි.

වජිර අබේවර්ධන මැතිතුමා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා ලෙස සිටින කාලයේ කටුවන ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙක් වන චන්ද්‍රසේන මහතා ද මෙවැනි ආකාරයට යෝජනාවක් කරන ලද බව ගරු ප්‍රා.ස. මන්ත්‍රී නාලක ලියනආරච්චි මහතා විසින් පවසන ලදි. සභාවක් වශයෙන් මෙය යෝජනා කර යැවිය හැකි නම් වඩාත් සුදුසු බවත්, 2003 වසරේ සිට මා සාම විනිසුරුවරයෙක් වශයෙන් කටයුතු කරන ලද බව වැඩිදුරටත් පවසන ලදි. සාම විනිසුරුවරයෙක් වශයෙන් ගමේ ජනතාවට සේවයක් කිරීමට අවස්ථාව ලබාදීම ඉතාමත් වටිනා බව එතුමාගේ අදහස විය.

07.11 බල ප්‍රදේශයේ අබලන් මාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා අදහස් දක්වමින් පවසා සිටියේ වසර 20 කට පමණ පෙර තාර දමා සංවර්ධනය කරන ලද මාර්ග වල දැනට තාර ගැලවී යන බවයි. එවැනි මාර්ගවල ජනතාවට ගමන් කිරීමට අපහසුතාවයක් මතු වී ඇත. එම නිසා එම අබලන් වී ඇති මාර්ග සංවර්ධනය කරගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පමණක් ලබාදෙන ලෙස ගම්වාසීන් ඉල්ලීම් කර ඇත.

ඒ අනුව ජනතාවගේ ශ්‍රම දායකත්වය ද ලබාගෙන බල ප්‍රදේශයේ අබලන් වී ඇති මාර්ග අලුත්වැඩියා කිරීමට සහ අරමුදලින් මුදල් ප්‍රතිපාදන යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ගුණතිලක ජයසේකර මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.ඩී. රත්නපාල මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

07.12 හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් එවා ඇති පානීය ජලය ලබාගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. මැදමුලන පල්ලෙමුලන පැහිරිවත්ත සහන් ජයසූරියගම නව ගම්මානය සඳහා පානීය ජලය ලබාදීමේදී සභාවේ ව්‍යාපෘතියක් වශයෙන් සභාවට මුදල් ලැබෙන ආකාරයට පොදු ජල මීටරයට සභාවෙන් මුදල් ගෙවා එම ගම්මානයෙන් අයකරගන්නා මුදල් සභාවට අයකර ගැනීමට සභාවේ සේවකයකු මගු කියවීම සඳහා යොදවා කටයුතු කිරීම හෝ පානීය ජලය ලබාදෙන ප්‍රදේශය වරිපනම් සීමාවක් සේ සලකා කටයුතු කිරීම යන කරුණු දෙකෙන් එකක් අනුව කටයුතු කරන ලෙස දන්වා ඇත.

මැදමුලන පල්ලෙමුලන පැහිරිවත්ත සහන් ජයසූරියගම නව ගම්මානය වරිපනම් සීමාවට ඇතුලත් කිරීම සුදුසු බවට ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එල්.ඒ. රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදී.

මැදමුලන පල්ලෙමුලන පැහිරිවත්ත නව ගම්මානය සඳහා පානීය ජලය ලබාදීමේදී එම ගම්මානය වරිපනම් බල ප්‍රදේශයක් බවට පත්කරන විට කොටබෝ සිට එම ප්‍රදේශයට යන මාර්ගයේ සියලුම පදිංචිකරුවන්ට වරිපනම් බදු ගෙවීමට සිදුවනු ඇති බවත්, මීට පෙර ඔවුන් වරිපනම් බදු නොගෙවා ඇති අතර, මෙම ජල ව්‍යාපෘතිය නිසා අනෙක් පදිංචිකරුවන්ට වරිපනම් බදු ගෙවීමට සිදුවීම ගැටලුවක් බව ගරු ප්‍රා.ස. මන්ත්‍රී නාලක ලියනආරච්චි මහතාගේ අදහස විය.

ඒ අනුව මැදමුලන පල්ලෙමුලන පැහිරිවත්ත සහන් ජයසූරියගම නව ගම්මානය වරිපනම් සීමාවට ඇතුලත් කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07.13 වලස්මුල්ල ගෝඝාතකාගාර ඉඩමේ පදිංචිකරුවන් තිදෙනා සඳහා වූ බදු ගිවිසුම් දීර්ඝ කිරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. වලස්මුල්ල ගෝඝාතකාගාර ඉඩමේ පදිංචි විජයකුමාර රමේෂ් මහතා, කේ. පුෂ්පරාණි මිය සහ රම්‍යණී මල්කාන්ති මියගේ බදු ගිවිසුම 2023.03.17 දිනෙන් අවසන් වේ.

ඒ අනුව වලස්මුල්ල ගෝඝාතකාගාර ඉඩමේ පදිංචි ඉහත නම් සඳහන් පදිංචිකරුවන්ගේ බදු ගිවිසුම 2023.03.17 සිට 2024.03.17 දින දක්වා වසරකින් දීර්ඝ කිරීම සුදුසු බව ගරු උප සභාපති අනුර ද අල්විස් මහතා විසින් යෝජනා කරන ලද අතර, ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.එස්.බී. විපුලසේන මහතා විසින් ස්ථිර කරන ලදින් ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමාගේ ස්තුති කතාව :-**

මා වසර 33 ක් මෙම සභාවේ මහජන නියෝජිතවරයෙක් වශයෙන් සේවය කරන ලද අතර, තවත් ඉගෙන ගැනීමට කාරණා ඇති බවත්, ගරු සභාපතිතුමා විසින් පවසන ලදී. මෙය ගෞරවනීය සභාවක් වන අතර, සියලු දෙනාම සභාවට ගෞරව කළ යුතුය. සභාවේ කටයුතු කරගෙන යාමට සියලු දෙනාම සහෝදරත්වයෙන් සහයෝගය ලබාදුන් අතර, ඒ සඳහා සියලු දෙනාටම ස්තූතිය පුදකරන ලදී. එසේම ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය ද මා හට ලබාදුන් සහයෝගය ස්තූතිය පුදකරන ලදී. එසේම අද දින රැස්වීමට පැමිණි ගරු උප සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුලු කාර්යාලයේ නිලධාරී මණ්ඩලයටත්, මාධ්‍යවේදී මහතාටත්, සංග්‍රහ කිරීමට පැමිණි සියලු දෙනාටමත්, ස්තූතිය පුද කරමින් සභාවේ කටයුතු නිමා කරන ලදී.

විසිර යාම :-

ප.ව. 2.00 ට පමණ සභාවේ කටයුතු නිමාවුයෙන් සභා තොරමේ සතුටින් විසිර ගියහ.

2023.03.15 දින,
වීරකැටිය ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේදීය.

ජයසේන ලියනආරච්චි
සභාපති
වීරකැටිය ප්‍රාදේශීය සභාව

**ජයසේන ලියනආරච්චි**
**සභාපති**
**ප්‍රාදේශීය සභාව - වීරකැටිය**

පිටපත් :-

1. පළාත් පාලන කොමසාරිස්තුමා
2. පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා
3. විගණන උප කාර්යාලය, හම්බන්තොට
4. මහජන පුස්තකාලය, වීරකැටිය